පුවතට අදාළ නොවන අවස්ථාවලදී කාන්තාවන්ගේ බාහිර පෙනුම හුවා දැක්වීම සහ භාවාතිෂය ලෙස වාර්තා කිරීම මාධ්‍ය තුළ ඇතැම් වීට දක්නට ලැබේ. එවැනි වාර්තාකරණයන් හි ගැටළුව වන්නේ, පාඨකයාට සිදුවීමට අදාළ කරුණු ග්‍රහණය නොවී යෑමට ඇති හැකියාවත්, එසේම යම් යම් අයවලුන් -විශේෂයෙන්ම මෙම සිදුවීම් වලට අදාළ කාන්තාවන්- ඒකකෘතික කිරීම්වලට ලක් වීමත් නිසායි.

අරුණ පුවත්පතේ (පෙබරවාරි 28, 2022 ) සහ මව්බිම සහ සිළුමිණ පුවත්පත් (මාර්තු 03, 2022) තුළ, නෙදර්ලන්තයේ සිට ලංකාවට පැමිණි කාන්තාවක් නානකාමරයේදී ජීවිතක්ෂයට පත් වීම පිළිබඳ පුවතක් වාර්තා වී තිබූ අයුරු ඊට නිදසුන් වේ.

1. පුවත් වාර්තා තුනෙහිම ඇයගේ බාහිර පෙනුම “නෙදර්ලන්ත රූමතිය”, “රූමත් කාන්තාවක්” වැනි සඳහන් කිරීම් ඔස්සේ හුවා දක්වා තිබිණි. මියගිය තැනැත්තියගේ බාහිර පෙනුම, ඇගේ මරණය සඳහා අදාළ වේ යැයි ඔබ සිතන්නේ ද?

2. එසේ අදාළත්වයක් නොමැති නම්, ඒ හරහා එම කාන්තාව ඒකාකෘත කිරීමකට (stereotyping) ලක් වීමත්, ඒ ඔස්සේ ඇයව කොන් කිරීමකට (discrimination) ලක් වීමත් සිදු නොවන්නේ ද?

3. මෙම ඇතැම් පුවත් වාර්තාවක් භාවාතිෂය අයුරකින් ලියැවී තිබිණි. “අනියම් කැදැල්ලක්”, “නිශාට වයස අවුරුදු 66ක් වූවද ඇය තුළින් පෙනුණු රාගාධික බැල්මට මොහුද සිත යටින් කැමැත්තක් දැක්විය”, “නෙදර්ලන්ත රූමතියට 66 යි, ලංකාවේ පෙම්වතාට 37 යි” වැනි සඳහන් කිරීම් ඊට උදාහරණ වේ. මෙවැනි භාවාතිෂය පුවත් වාර්තා කිරීම් ඔස්සේ, සිදුවීමට වඩා, එම මියගිය කාන්තාවගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ පූර්ව විනිශ්චයන්ට පාඨක අවධානය යොමු නොවන්නේ ද?